| | | |
|---|---|---|
| තේමාව | ජලය | |
| විෂය | චිත්‍ර | |
| පන්තිය | 6 ශ්‍රේණිය | |
| පාඩම | 1.1.2 | ජලය ආශ්‍රිතව නිතර දකින සතුන් ඇඳ වර්ණ ගන්වමු. |
| අරමුණ (නිපුණතා මට්ටම) | - | සංරචන මූලිකාංග<br>රේඛා<br>වර්ණ භාවිතය<br>හැඩතල<br>තලය භාවිතය |

---

**01. පෙර ඉගෙනුම**

- ජලය ආශ්‍රිත පරිසරයේ නිතර දකින සතුන් නිරීක්ෂණය කරන්න.
- ජලය ආශ්‍රිත පරිසරයේ නිතර දකින සතුන්ගේ ඡායාරූප හා චිත්‍ර සොයා එක් රැස් කරගන්න.
- යූ ටියුබ් නාලිකා, අන්තර් ජාලය, ඩිස්කවරි නාලිකාවල ජලජ පරිසරයේ ජීවත් වන සතුන්ගේ චමත්කාරය දකින්න.
- සතුන්ගේ වර්ණ, හැඩතල හා ජලය ආශ්‍රිත පරිසරය හොඳින් අධ්‍යයනය කරන්න.

**02. පන්ති කාමරයේ ඉගෙනුම**

- ඔබ විසින් රැගෙන ආ ජලජ පරිසරයේ නිතර දකින සතුන්ගේ ඡායාරූප පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.
- සොබා දහම ජලය ආශ්‍රිත පරිසරයේ ජීවත් වෙන සතුන්ට ලබා දී ඇති වර්ණ, හැඩතල, රිද්ම පිළිබඳව දරුවන් සමඟ සාකච්ඡා කරන්න.
- ජලය ආශ්‍රිත පරිසරයේ නිතර දකින ඔබ සිත්ගත් සතෙකුගේ චිත්‍රයක් ඇඳ වර්ණ ගැන්වීමට උපදෙස් ලබා දෙන්න.
- අඳින ලද දළ සටහන් වර්ණ ගැන්වීමට පෙර අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබාදීම.
- දියසායම් හෝ පැස්ටල් භාවිතා කරමින් චිත්‍රය වර්ණ ගැන්වීමට අවශ්‍ය උපදෙස් ලබාදීම.
- වර්ණ භාවිතය පිළිබඳව උපදෙස් ලබා දෙමින් දරුවන් දිරි ගැන්වීම.
- දරුවන්ගේ නිර්මාණ පන්තියේ ප්‍රදර්ශනය කර අගය කිරීම.

**03. පසු ඉගෙනුම**

- ජලය ආශ්‍රිත පරිසරයේ නිතර දකින සතුන් පිළිබඳව ඔබ නිරීක්ෂණය කළ තොරතුරු හා පන්ති කාමරයේදී අඳින ලද චිත්‍රය ඇසුරින් නව නිර්මාණයක් කිරීම.

  උදා:- බිත්ති සැරසිල්ලක් සකස් කිරීම.
  ආදර්ශ මාළු ටැංකියක් සකස් කිරීම.

**04. පාඩම ඉගෙනීම සඳහා අවශ්‍ය සහාය ලබා ගත හැකි මුද්‍රිත, ශ්‍රව්‍ය, දෘෂ්‍ය, online මාධ්‍යය (web පිටු හා සබඳතා)**

i. ඩිස්කවරි නාලිකාව
ii. ඇනිමල් ප්ලැනට්
iii. පාසල් පුස්තකාලයේ ඇති සතුන් පිළිබඳ එන්සයික්ලෝපීඩියා
iv. යූ ටියුබ් නාලිකාව